**පැළෑණ සිරි වජිරඥාණ දහම් පාසල - වැලිගම**

ශ්‍රී බු. ව. 2566 - පළමුවාර පරීක්ෂණය - 2022 අගෝස්තු

06 - ශ්‍රේණිය

**කාලය පැය 02 යි.**

**විභාග අංකය:-**……………………………………………………..

## II කොටස

**(එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 04 බැගින් මුළු ලකුණු සංඛ්‍යාව ලකුණු 40 කි.)**

(01) නිදහනක් බදුය බොදු දරු කැළ නාමෙන්
සිසිලක් ලද හැකිය සදහම් දිය බීමෙන්
සෝදුක් දුරැර ලැබ සතුටින් සාමෙන් යන කවියේ ඉතිරි පදය වන්නේ,

i.පින්බර දේශයේ පින් සිතිවිලි පුරන ii.මිහිරක් ලැබේ දම් පාසල වෙත ඒමෙන්

iii.බෝසත් දරු කැළකි දම් පාසලෙ සිටින

(02) පන්සිල් සුරැක ඉසිකෝමන් බිඳ ලන්න
සිත්මල් පුබුදුවා පින්කම් කරගන්න
පන්සිල් බිමේ දම් පාසල වෙත එන්න යන කවියේ තෙවන පද්‍ය පාඨය වන්නේ,

i.තුන්කල් එක සිතින් සම්බුදු මග යන්න ii.නුවණින් යුතුව දහැමිව සිය දිවි ගෙවති

iii.සෝදුක් දුරැර ලැබ සතුටින් සාමෙන්

(03) සංගායනා යන්නෙහි අරුත වන්නේ,

i.සාමූහිකව කියවීම යන්නයි ii.ධර්මය දේශනා කිරීම යන්නයි

iii.බුද්ධ දේශනය යන්නයි

(04) පළමුවන ධර්ම සංගායනාව පවත්වන ලද්දේ බුද්ධ පරිනිර්වාණයෙන් කොපමණ කලකට පසුවද?

i.හයමසකට පස ii.තෙමසකට පස ii.අවුරුදු පහකට පසු

(05) පළමු ධර්ම සංගායනාව පැවැත්වූයේ කුමන ස්ථානයේදී ද?

i.සප්තපර්ණී ගුහාවේ දී ii.රජගහ නුවර iii.වේළුවනාරාමයේ දී

(06) විනයධර භික්ෂූන් වහන්සේලා අතර අග තනතුර ලැබූ භික්ෂූන් වහන්සේ කවුද?

i.මහාකාශ්‍යප තෙරණුවෝ ii.නන්ද තෙරුන් වහන්සෙ iii.උපාලි තෙරුන් වහන්සේ

(07) පළමු ධර්ම සංගායනාවේ දී මහාකාශ්‍යප මහරහතන් වහන්සේ විසින් විනය සම්බන්ධ සියලුම ප්‍රශ්න අසන ලද්දේ කුමන භික්ෂූන් වහන්සේගෙන් ද?

i.උපාලි මහරහතන් වහන්සේ ii.සුභද්‍ර භික්ෂූන් වහන්සේ

iii.නන්ද තෙරුන්

(08) "විනය වූ කලි........................." හිස්තැනට වඩාත්ම ගැළපෙන පිළිතුර වන්නේ,

i.සංවරව හැසිරීම යි. ii.බුදු සසුනේ ආයුශය යන්න යි.

iii.නිවැරදිව කතා කිරීම යන්න යි.

(09) සුදනන් ඇසුර ලැබ සත්ගුණ දම් රකිති

නුවණින් යුතුව දැහැමිව සිය දිවි ගෙවති

සදහම් බලෙන් කවදත් සුව සෙත ලබති යන කවි පන්තියේ පළමු කවි පේළිය වන්නේ,

i.එක මවකගේ දරු පිරිසක් ලෙස සිතන ii.පන්සල් බිමේ දම් පාසල වෙත එන්න

iii.දන්සිල් භාවනා දස පින් වල යෙදෙති

(10) බෞද්ධයාගේ අත්පොත ලෙස හඳුන්වන්නේ කුමන ග්‍රන්ථය ද?

i.සුභාෂිතය ii.ධම්ම පදය iii.ලෝකෝපකාරය

## II කොටස

**(එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.)**

(01) i.ත්‍රිපිටකය නම් කරන්න.

ii.ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළේ කොහේදී ද?

iii.විනයධාරී භික්ෂූන් වහන්සේලා අතර අග තනතුර ලැබූ භික්ෂූන් වහන්සේ කවුරුන් ද?

(02) i.බෞද්ධයෙකු තුළ දක්නට ලැබෙන ලක්ෂණ 05 ක් ලියා දක්වන්න.

ii.බෞද්ධයෙකු වශයෙන් තමන් තුළ නොතිබිය යුතු ගුණාංග 05 ක් ලියා දක්වන්න.

iii.බෞද්ධ ජීවිතයේ වැදගත්ම ලක්ෂණය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

(03) i.බෞද්ධයාට ඇසළ පොහොය වැදගත් වන්නේ ඇයි දැයි කරුණු 05 ක් ලියා දක්වන්න.

ii.නුවර මහා පෙරහැර ආරම්භ වූයේ කුමන සිව් දේවාල මුල් කරගෙන ද?

iii.ඇසළ මාසයේ පැවැත්වෙන විවිධ උත්සව 05 ක් ලියා දක්වන්න.

(04) i.චතුරාර්ය සත්‍ය ලියා එහි තේරුම ලියා දක්වන්න.

ii.වැසිකිළි භාවිතයේ දී පිරිසිඳුකමට අදාළව බුදු දහමෙහි සඳහන් වන සිරිත් තුන ලියා දක්වන්න.

iii.තමන්ගේ ගෙවත්ත පිරිසිඳුව තබා ගැනීමෙන් අත්වන වාසි 05 ක් ලියා දක්වන්න.